සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 61 S I |
|---|---|---|

නම: ..............................................

# භූගෝල විද්‍යාව I

කාලය පැය තුනයි

- **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විතය.**
- **එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

- **ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

01. පෘථිවි ව්‍යූහයට අනුව එහි ස්කන්ධයෙන් 2/3 ක් ම .............................. ට අයත් වෙයි. (කබොල / ප්‍රාවරණය / හරය)

02. ශ්‍රී ලංකාවේ බහුලවම භාවිත වන බලශක්ති ප්‍රභවය වන්නේ ..........................
(ජෛව ස්කන්ධ ය. / පෙට්‍රෝලියම් ය. / ජල විදුලිය ය.)

03. කර්කටක නිවර්තනයත් ආක්ටික් වෘත්තයත් අතර .......................... කලාපය පිහිටා ඇත. (නිවර්තන / සෞම්‍ය / ශීත)

04. ශ්‍රී ලංකාවේ බහුලවම හටගෙන ඇති ස්වභාවික උපද්‍රවය වන්නේ ..........................
(නායයාම් ය. /නියගය ය. /සුළි සුළං ය.)

05. ලැංකෂයර් යපස් නිෂ්පාදන මධ්‍යස්ථානය .................................................... තුළ පිහිටා ඇත.
(රුසියාව / චීනය / එක්සත් රාජධානිය)

- **අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් "නි" යන්න වටා ද , වැරදි නම් "වැ" යන්න වටාද රවුමක් අඳින්න.**

06. "හුණුගල්" අවසාදික පාෂාණ ගණයට අයත් පාෂාණයකි . ( නි / වැ )

07. පාංශු පැතිකඩක C මහල හොඳින් වර්ධනය වූ පාංශු කොටස් වලින් සමන්විතය. ( නි / වැ )

08. ගොඩබිම සිදුවන භූමිකම්පා මඟින් සුනාමි හටගනී ( නි / වැ )

09. ශ්‍රී ලංකාවේ දකුණු පළාත තුළ වැඩිම ජන සංඛ්‍යාවක් ජීවත් වන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ ය ( නි / වැ )

10. ලෝකයේ ප්‍රධාන මිනිරන් නිෂ්පාදකයා වන්නේ ඉන්දියාවයි. ( නි / වැ )

- **අංක 11 සිට 16 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

11. ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණ ආයතනය ...................................... ප්‍රදේශයේ පිහිටා තිබේ.

12. ශ්‍රී ලංකා 1:50000 භූ ලක්ෂණ සිතියම් වල සමෝච්ච රේඛා අන්තරය මීටර් ................................. කි.

13. භූමිකම්පා, නායයාම්, සුනාමි අයත් වන්නේ ............................................... උපද්‍රව ගණයට ය.

14. ඕස්ට්‍රේලියාවේ ........................................................................ නිම්නය ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශයකි.

15. මොනරාගල දිස්ත්‍රික්කයේ ඔක්කම්පිටිය වටිනා .......................................... වර්ග හමුවන ප්‍රදේශයකි.

16. කලපු හා මෝය ආශ්‍රිත ප්‍රදේශවල ............................................ ශාක විශේෂ ව්‍යාප්තව පවතී.




NWP EXAMRESULTS.LK

- අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කර ගන්න.

17. යල කන්නයේ වැඩිම වී නිෂ්පාදනය වාර්තා වන්නේ .................. වර්ෂයේ ය.

18. 1985 සහ 1986 වර්ෂවල යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් ......................... ක් පමණ වේ.

19. වසර 2000 න් පසු අඩුම වී නිෂ්පාදනය වාර්තා වන්නේ ....................... වර්ෂයේ ය.




- අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල "අ" සහ "ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. "අ" තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙලට අනුව "ආ" තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.

20.

| "අ" | "ආ" |
|---|---|
| <u>භූ තැටිය</u> | <u>අයත් රටවල්</u> |
| 1. අප්‍රිකා තැටිය | A. ඉන්දුනීසියාව |
| 2. ඉන්දු ඕස්ට්‍රේලියා තැටිය | B. ආර්ජන්ටිනාව |
| 3. දකුණු ඇමරිකා තැටිය | C. ලිබියාව |
| | D. කැනඩාව |

1. C,A,D 2. B,D,A 3. D,C,B 4. C,A,B (............)

21.

| "අ" | "ආ" |
|---|---|
| <u>වී වගා කලාප</u> | <u>අයත් දිස්ත්‍රික්ක</u> |
| 1. වියළි කලාපය | A. කුරුණෑගල |
| 2. අතර මැදි කලාපය | B. හම්බන්තොට |
| 3. තෙත් කලාපය | C. මහනුවර |
| | D. ගාල්ල |

1. A,B,D 2. D,A,C 3. B,A,D 4. B,C,D (............)

22.

| "අ" | "ආ" |
|---|---|
| <u>සාගර කොටස</u> | <u>සීමාව</u> |
| 1. රාෂ්ට්‍රීය මුහුද | A. නා.සැ. 12-24 |
| 2. යාබද මුහුද | B. නා. සැ. 24-200 |
| 3. පරම ආර්ථික කලාපය | C. නා.සැ. 200 ට වැඩි |
| | D. නා.සැ. 12 |

1. D,A,B 2. D,A,C 3. A,C,B 4. B,A,C (............)

23.

| "අ" | "ආ" |
|---|---|
| <u>ප්‍රධාන සංචාරක කලාප</u> | <u>සංචාරක ස්ථාන</u> |
| 1. පුරාණ නගර කලාපය | A. හික්කඩුව |
| 2. දකුණු වෙරළ කලාපය | B. දළදා මාළිගාව |
| 3. නැගෙනහිර වෙරළ කලාපය | C. ආරුගම්බේ |
| | D. මීගමුව |

1. D,A,C 2. B,A,C 3. C,D,A 4. B,C,A (............)

24. "අ" "ආ"

| සාගරය | ගලාබසින ගංගාව |
|---|---|
| 1. පැසිපික් සාගරය | A. යෙනිසි ගඟ |
| 2. අත්ලාන්තික් සාගරය | B. ගංගා නම් ගඟ |
| 3. ඉන්දියන් සාගරය | C. හොවැංහෝ ගඟ |
| | D. ඇමර්සන් ගඟ |

1.A,C,D 2. D,A,B 3. C,D,B 4. B,D,C (.........)

- අංක 25 සිට 40 තෙක් ඇති එක්එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.

25. ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග සිතියම්ගත කිරීමේ දී යොදා ගන්නේ මින් කුමන වර්ණයද ?
1. රතු 2. දම් 3. කහ 4. කළු (.........)

26. පහත සඳහන් සම්පත් අතරින් ක්ෂය වන සම්පතක් නොවන්නේ කුමක් ද?
1. සරු පස 2. වාතය 3. පොසිල ඉන්ධන 4. පාෂාණ (.........)

27. ශ්‍රී ලංකාව තුළ ජල විදුලි බලය වැඩි වශයෙන් යොදා ගනු ලබන්නේ,
1. ගෘහස්ථ කටයුතු සඳහා ය. 2. කර්මාන්ත සඳහා ය.
3. වාණිජ කටයුතු සඳහා ය. 4. වීදි ලාම්පු සඳහා ය. (.........)

28. පංච මහා විල් වලට අයත් වන විලක් වන්නේ,
1. ඔන්ටාරියෝ ය. 2. වික්ටෝරියා ය. 3. ටිටිකාකා ය. 4. විනිපෙග් ය. (.........)

29. පෘථිවි වායුගෝලීය සංයුතියෙන් 78.09% ක් ම පවතින වායුව මින් කුමක් ද?
1. ආගන් 2. ඔක්සිජන් 3. නයිට්‍රජන් 4. කාබන්ඩයොක්සයිඩ් (.........)

30. වර්තමානයේ මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයේ ප්‍රමුඛතම රට බවට පත්ව ඇත්තේ ,
1. ජර්මනිය යි. 2. ජපානය යි. 3. එක්සත් රාජධානිය යි. 4. චීනය යි. (.........)

31. සුළු අපනයන භෝගයක් වන පැඟිරි වගාව ව්‍යාප්තව ඇති ප්‍රධාන දිස්ත්‍රික්ක දෙක වන්නේ,
1. ගාල්ල හා මාතර ය. 2. කෑගල්ල හා රත්නපුර ය.
3. මාතලේ හා මහනුවර ය. 4. මාතර හා හම්බන්තොට ය. (.........)

32. කිවුල්දිය ධීවර කර්මාන්තයෙන් අල්ලා ගන්නා මසුන් වර්ග පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
1. ඉස්සා, තිලාපි, තෝරා 2. සාලයා, හුරුල්ලා, පියාමැස්සා
3. ඉස්සා, දැල්ලා, කකුළුවා 4. තිලාපි, පොකිරිස්සා, බලයා (.........)

33. කේතුධර වනාන්තර වල දක්නට ලැබෙන ශාක වර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ඕක්, චෙස්නට්, බීච් 2. ස්ප්‍රෘස්, ෆර්, පොප්ලර්
3. අකේෂියා. බීච්, පයින් 4. පයින්, මේපල්, ඈෂ් (.........)

34. පෘථිවි ජල ව්‍යාප්ති අවස්ථා අනුව ප්‍රයෝජනයට ගත හැකි මතුපිට ජලය (මිරිදිය) සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
1. ගංගා ජලය 10% කි. 2. විල් ජලය 52% කි.
3. පාංශු ජලය 38% කි. 4. ජල වාෂ්ප 8% කි. (.........)

35. • සෞම්‍ය කලාපීය ප්‍රදේශ • සිසිල් දේශගුණය • වෙනත් වගාවන් සඳහා යොදාගත නොහැකි බිම් ඉහත සඳහන් සාධක අවශ්‍ය වන්නේ පහත සඳහන් කවර කෘෂිකාර්මික කටයුත්තක් සඳහා ද?
1. සත්ව පාලනය 2. තිරිඟු වගාව 3. ඉරිඟු වගාව 4. රබර් වගාව (.........)

36. ලෝකයේ යකඩ හා වානේ වලට තිබූ ඉල්ලුම අඩු වීමට බලපෑ ප්‍රධාන හේතුව
1. ෆයිබර් සොයා ගැනීමයි 2. ඇලුමිනියම් සොයා ගැනීමයි
3. තඹ සොයා ගැනීමයි 4. ප්ලැටිනම් සොයා ගැනීමයි. (.........)

37. 1:50000 භූ ලක්ෂණ සිතියමක පහළ වට තීරුවේ දක්වා ඇති තොරතුරක් වන්නේ මින් කුමක් ද?

1. සිතියම් වර්ගය
2. අක්ෂාංශ, දේශාංශ අගයන්
3. රේඛීය පරිමාණය
4. මාර්ගවල ගමනාන්ත (.........)

- **පහත A, B, C හා D මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 38 සිට 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - 1. දරිද්‍රතාව
2. පෝෂණ ඌනතා

B - 1. සංවර්ධනය
2. සුඛසාධන වියදම්

C - 1. තොරතුරු තාක්ෂණය
2. සංස්කෘතිය

D - 1. සංක්‍රමණ
2. යටිතල පහසුකම්

38. දෙවැන්නේ වැඩිවීම පළමුවැන්නේ අඩුවීමට හේතු වන මාතෘකා යුගලය කුමක් ද?

1. A  2. B  3. C  4. D (.........)

39. පළමු වැන්නේ දියුණුව දෙවැන්නේ පරිහානියට හේතුවිය හැකි මාතෘකා යුගලය කුමක් ද?

1. A  2. B  3. C  4. D (.........)

40. පළමු වැන්නේ වැඩිවීම හා අඩුවීම දෙවැන්නේ වැඩිවීමට හා අඩුවීමට හේතු වන මාතෘකා යුගලය කුමක් ද?

1. A  2. B  3. C  4. D (.........)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

| 11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 61 S II |
|---|---|---|
| නම: .................................... | භූගෝල විද්‍යාව II | කාලය තුනයි එකයි |

- **මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.**
- **I කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ) , (ආ) සහ (ඉ) යන කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය.**
- **II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

(01) (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා 1:50000 හු ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

- අංක (i) සිට (iv) තෙක් ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

i. A චතුරස්‍රය තුළ දක්නට ලැබෙන ජලවහන ලක්ෂණය කුමක් ද?
(ගං දඟරය / හැඩපලු ගංගාව/ වගුරුබිම) (ල. 01)

ii. C චතුරස්‍රය තුළ දක්නට ලැබෙන භෞතික ලක්ෂණය වන්නේ, (ගල / ගල්වල / වැලිතලාව) (ල. 01)

iii. F අක්ෂරයෙන් දැක්වෙන සංස්කෘතික ලක්ෂණය වන්නේ
(නගර සීමා මායිම ය/ දිය බෙත්ම ය/ අඩිපාර ය) (ල. 01)

iv. G අක්ෂරයෙන් පෙන්නුම් කරන ස්වභාවික වෘක්ෂලතා වර්ගය (වනාන්තර / ලඳු කැලෑ/ තණ බිම්) (ල. 01)

v. සිතියමේ ඊසාන කාර්තුව තුළ දක්නට ලැබෙන ව්‍යාපාරික බෝගය කුමක් ද? (ල. 01)

vi. E අක්ෂරයෙන් දැක්වෙන චතුරස්‍රය තුළ දක්නට ලැබෙන පොදු සේවා සපයන ආයතන දෙකක් සඳහන් කරන්න. (ල. 02)

- සිතියම්ගත ප්‍රදේශය හා සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ. ඒවා නිවැරදි නම් "නි" යන්න ද වැරදි නම් "වැ" යන්න ද යොදන්න.

vii. B චතුරස්‍රය තුළ අරීය ජලවහන රටාවක් පෙන්නුම් කරයි. (ල. 01)

viii. ප්‍රධාන ගංගාව ගලා බසින්නේ දකුණු දිශාවටය. (ල. 01)

ix. සිතියම්ගත ප්‍රදේශයේ පුළුල්ව පැතිරුණ වී වගා බිම් දැකිය හැකිය. (ල. 01)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුවේ කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නිවැරදි කොටුව තුළ ලියන්න. (ල. 05)


i. ඕකොට්ස් මුහුද - A, B, C
ii. අයිස්ලන්තය - I, J, K
iii. මෙක්සිකෝ සානුව - P, Q, R
iv. නයිජර් ගඟ - S, T, U
v. ඊශ්‍රායලය - F, G, H

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව දක්වා ඇති තීරුවේ කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නිවැරදි කොටුව තුළ ලියන්න. (ල. 05)

i. මාතලේ දිස්ත්‍රික්කය - A, B, C
ii. ගල් ඔය - G, H, I
iii. සමනල වැව - D, E, F
iv. යාපනය - M, N, O
v. බෙල්ලන්විල අභය භූමිය - R, S, T

## II - කොටස




(02) යාබදව දක්වා ඇත්තේ පෘථිවි වායුගෝලයේ ස්තර දක්වෙන රූප සටහනකි.

i. අංක 2 හා 4 න් දක්වෙන ස්තර දෙක නම් කරන්න. (ල. 02)


ii. අංක 3 න් දක්වෙන ස්තරයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 03)

iii. a) A අක්ෂරයෙන් දක්වෙන් වායුගෝලීය සීමාව කුමක් ද?

b) වායුගෝලය හා ශිලාගෝලය අතර ජලය හුවමාරු වන ක්‍රියාවලිය හඳුන්වන නම කුමක් ද?

c) ඉහත ඔබ සඳහන් කළ ක්‍රියාවලියේ අවස්ථා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

- **ප්‍රශ්න අංක 3 හා 4 සඳහා පිළිතුරු සැපයීමට පහත දක්වෙන ලෝක සිතියම උපයෝගී කරගන්න.**




(03) i. A හා B අක්ෂර වලින් දක්වෙන වනාන්තර වර්ග දෙක සඳහන් කරන්න. (ල. 02)

ii. a) C වලින් දක්වෙන වනාන්තර වර්ගය නම් කරන්න.

b) එම වනාන්තර ව්‍යාප්ත ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න. (ල. 03)

iii. a) ශ්‍රී ලංකාවේ නිවර්තන තෙත් වනාන්තර වල ලක්ෂණ දෙකක් ලියන්න.

b) ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(04) i. a) අංක 1 න් දක්වෙන තිරිඟු වගා කරන රටද

b) අංක 2 න් දක්වෙන වී වගා කරන ප්‍රදේශය ද නම් කරන්න. (ල. 02)

ii. රබර් වගාව ව්‍යාප්තිය සඳහා අවශ්‍ය වන භෞතික සාධක තුනක් සඳහන් කරන්න. (ල. 03)

iii. ශ්‍රී ලංකාවේ කිරි පට්ටි පාලනය නගා සිටුවීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. (ල. 05)

(05) i. ලෝකයේ නැව් තැනීමේ කර්මාන්තයේ ප්‍රමුඛ රටවල් දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ii. කපු පිළි කර්මාන්තයේ ප්‍රවණතා තුනක් සඳහන් කරන්න. (ල. 03)

iii. a) ශ්‍රී ලංකාවේ ගෘහ කර්මාන්ත වර්තමානයේ මුහුණපාන ගැටළු දෙකක් ලියන්න.

b) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ මෑත කාලීන ප්‍රවණතා දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)

(06) i. ලෝක ජන සංඛ්‍යා වර්ධනයේ කැපී පෙනෙන අවධි දෙක සඳහන් කරන්න. (ල. 02)

ii. a) 2012 ජන සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධන වේගය කොපමණ ද?

b) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධ වේගය වැඩිම දිස්ත්‍රික්කය හා අඩුම දිස්ත්‍රික්කය සඳහන් කරන්න. (ල. 03)

iii. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහයේ සුවිශේෂී ලක්ෂණ තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(07) i. පරිසරයට අහිතකර බලපෑම් ඇති කරන මානුෂ ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ල. 02)

ii. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා එල්ල වී ඇති බලපෑම් තුනක් සඳහන් කරන්න (ල. 03)

iii. a) දේශගුණික වෙනස්වීම් නිසා මානව කටයුතු වලට ඇති වන බලපෑම් දෙකක් ලියන්න.

b) දේශගුණික වෙනස්වීම් අවම කර ගැනීම සඳහා ඔබට දායක විය හැකි ආකාරය කරුණු දෙකක් මගින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(08) • පැරකුටින් • එට්නා • ක්‍රැකටෝවා • විසූවියස්

i. ඉහත ගිනිකඳු අතරින්

a) ඉතාලියේ පිහිටි ගින්කන්දක් හා

b) ඉන්දුනීසියාවේ පිහිටි ගින්කන්දක් නම් කරන්න. (ල. 02)

• හරිකේන් • සයික්ලෝන් • ටයිෆූන් • විලිවිලීස්

ii. සුළි සුළං හඳුන්වන ඉහත නම් අතරින්,

a) උතුරු අත්ලන්තික් සාගරයේ දී,

b) බෙංගාල බොකත්ක අවට ඉන්දියන් සාගරයේ දි හා

c) නැගෙනහිර ආසියාවට ඔබ්බෙන් වූ පැසිපික් සාගරයේ දී හඳුන්වන නම් පිළිවෙලින් ලියන්න. (ල. 03)

iii. a) ශ්‍රී ලංකාවේ බහුලව ජල ගැලීම් වලට ලක්වන ගංගා දෙකක් සඳහන් කරන්න.

b) ජල ගැලීම් ආපදාව අවම කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 61 S II

නම: ........................................

(01) භූගෝල විද්‍යාව II
பவியியல் II
Geography II

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි.
For Examine's Use Only.

1. (අ) / (அ) / (a)

(i) ..........................................................................................

(ii) ..........................................................................................

(iii) ..........................................................................................

(iv) ..........................................................................................

(v) ..........................................................................................

(vi) • ..........................................................................................

• ..........................................................................................


(vii) ..........................................................................................

(viii) ..........................................................................................

(ix) ..........................................................................................

10


(ආ)




(i)
(ii)
(iii)
(iv)
(v)

/5

(ඉ)




(i)
(ii)
(iii)
(iv)
(v)

/5

1. (අ) /10 (ආ) /5 (ඉ) /5 = /20

(10) www.PastPapers.WiKi (9)


සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

11 ශ්‍රේණිය
தரம் 11
Grade 11

වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024)
ஆண்டிறுதி பரீட்சை - 2023(2024)
**Year End Term Test 2023(2024)**

භූගෝල විද්‍යාව II - **புவியியல் - Geography II**




SCALE 1 : 50,000

සමෝච්ච රේඛා අන්තරය මීටර 20 | சமவுயரக்கோட்டு இடைவெளி 20 மீற்றர் | Contour Interval 20 metres

PAST PAPERS WIKI

# භූගෝල විද්‍යාව
## 11 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 1 - ප්‍රාරවණය | 11 - තලවකැලේ | 21 - 3 | 31 - 4 | |
| 2 - ජෛව ස්කන්ධ | 12 - 20 | 22 - 1 | 32 - 3 | |
| 3 - සෞම්‍ය | 13 - භූ විද්‍යා | 23 - 2 | 33 - 2 | |
| 4 - නායයාම් | 14 - මරේඩලිං | 24 - 3 | 34 - 1 | |
| 5 - එක්සත් රාජධානිය | 15 - මැණික් | 25 - 2 | 35 - 1 | |
| 6 - නි | 16 - කඩොලාන | 26 - 2 | 36 - 2 | |
| 7 - වැ | 17 - 2021 | 27 - 1 | 37 - 3 | |
| 8 - වැ | 18 - 900 | 28 - 1 | 38 - 2 | |
| 9 - නි | 19 - 2017 | 29 - 3 | 39 - 3 | |
| 10 - නි | 20 - 4 | 30 - 4 | 40 - 1 | (1x40 = 40) |

### II පත්‍රය

I කොටස

(01) අ) i. හැඩපළු ගංගාව  ii. ගල  iii. අඩිපාර  iv. ලඳු කැලෑ  v. රබර්
vi. පාසල/පොලීසිය / රෝහල/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
vii. නි  viii. නි  ix. වැ  (ල. 10)

ආ) i. B  ii. I  iii. R  iv. T  V. H  (ල. 05)
ඉ) i. A  ii. G  iii. E  iv. N  v. T  (ල. 05)

II කොටස

(02) i. 2 - මෙසෝගෝලය  4 - පරිවර්තී ගෝලය  (ල. 02)
ii. අපරිවර්තිගෝලය
- උන්නතාංශය සමග උෂ්ණත්වය ඉහළ යාම.
- ඕසෝන් ස්ථරය පිහිටා තිබීම.
- අහිතකර පාරජම්බුල කිරණ පැමිණීම වළක්වාලීම.
- උල්කාෂ්ම දැවී විනාශ වී යාම.
- සුපර් සොනික් ජෙට් යානා පියාසර කිරීම.

ස්ථරය නම් කිරීමට හා කරුණු 2 ක් දැක්වීමට (ල. 03)

iii. a) පරිවර්තී මණ්ඩලය  b) ජල චක්‍රය
c) වාෂ්පීකරණ / උත්ස්වේදනය / ඝනීභවනය / වර්ෂණය / මතුපිට ගලායාම/ කාන්දුවීම
මින් දෙකක් පැහැදිලි කිරීමට (ල. 05)

(03) i. A - කේතුධර වනාන්තර  B - සෞම්‍ය කලාපීය වනාන්තර  (ල.02)
ii. a) නිවර්තන වර්ෂා වනාන්තර
b) • ඇමර්සන් ද්‍රෝණිය  • කොංගෝ ද්‍රෝණිය  • ආසියානු ප්‍රදේශය  (ල. 03)
iii. a) • අවුරුද්ද මුළුල්ලේම ශාක වර්ධනය
- වනාන්තර තද කොළ පැහැතිවීම
- වියන් ස්ථර කිහිපයකින් යුක්තවීම.
- යටිරෝපණය බහුලය.
- හොර, කීන, ගොඩපර, මිල්ල, මිදෙල්ල ආදී ශාක බහුලය
- 2000 mm ට වැඩි වර්ෂාපතනය හා $27C^0$ පමණ උෂ්ණත්වය ආදී ...

b) • ජාතික රක්ෂිත හා අභය භූමි පවත්වාගෙන යාම
- වන වගා ව්‍යාපෘති ඇති කිරීම.
- වන සංරක්ෂණ උපාය මාර්ග අනුගමනය (සෝල්ට් ක්‍රමය ආදී)
- ප්‍රජා සහභාගීත්ව වන වගා දිරිගැන්වීම. (පෙළ පොත 11 ශ්‍රේණිය 41 පිටුව)  (ල. 05)

(04) i. a) 1 - ප්‍රංශය  b) 2 - මැඩගස්කරය  (ල. 02)
ii. • 2000 mm පමණ වර්ෂාපතනය  • $27C^0$ පමණ උෂ්ණත්වය
- කබොක් මිශ්‍ර රතු පස  • මද බෑවුම් සහිත බිම්  (ල. 03)

iii. • පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම (අඹේවෙල / වල්පිට / කනන්විල)
- නව දෙනුන් හා තෘණ වර්ග හඳුන්වාදීම.
- උපදෙස් ලබාදීම.
- ණය හා ආධාර ලබාදීම.
- පශු වෛද්‍ය සේවාව ආදී ...  (ල. 05)

(05) i. • දකුණු කොරියාව • චීන • ජපානය (ල. 02)

ii. • වර්තමානයේ කපු වවන රටවල් ද කර්මාන්තයට අවතීර්ණ වීම.

• අතීතයේ යුරෝපා රටවල් ප්‍රමුඛයන් වුවද වර්තමානයේ නැගෙනහිර ආසියාතික රටවල් ප්‍රමුඛයන් වීම.

• නිෂ්පාදනය මුළුමනින්ම යාන්ත්‍රිකරණය වීම නිසා තත්ත්වයෙන් උසස් නිෂ්පාදන බිහිවීම.

• වෙනත් කෙඳි වර්ග සමඟ මිශ්‍ර කර විවිධ ගුණාත්මක බවින් යුතු නිෂ්පාදන සිදු කිරීම, (කෘතිම කෙඳි, ලෝම , හණ)

• පරිසර හිතකාමී නිෂ්පාදන සිදුකිරීම.

• අතුරු කර්මාන්ත බිහිවීම (රෙදි වර්ණ ගැන්වීම / ඇඟලුම් නිෂ්පාදන) (ල. 03)

iii. a) • කාර්මික අමුද්‍රව්‍ය ලබාගැනීමේ ගැටළු • ශ්‍රම හිඟය

• ආදේශක ආනයනය නිසා ඇතිවන බලපෑම • නිෂ්පාදන වියදම ඉහළ යාම (ල. 02)

b) • වේගවත් දියුණුවක් ඇතිවීම.

• සංචාරක පහසුකම් කඩිනමින් වැඩි දියුණු කිරීම. • සෘජු හා වක්‍ර රැකියා අවස්ථා වැඩිවීම.

• රාජ්‍ය හා පෞද්ගලික ආයෝජකයන්ගේ අනුග්‍රහ ලැබීම.

• බහුවිධ අරමුණු පෙරදැරිව කෙරෙන සංචාරක කටයුතුවල සිදුවන වර්ධනය (සංස්කෘතික , පාරිසරික) (ල. 05)

(06) i. • දීර්ඝ කාලයක් තිස්සේ මන්දගාමී වර්ධනයක් සිදු වූ අවධිය (මානවයාගේ ආරම්භයේ සිට ක්‍රි.ව. 1750 දක්වා)

• කෙටි කාලයක් තුළ සීඝ්‍ර වර්ධනයක් සිදු වූ අවධිය (1750 සිට අද දක්වා) (ල. 02)

ii. a) 0.7%

b) වැඩිම - අනුරාධපුරය (1.33%)

අඩුම - නුවරඑළිය (0.05%) (ල. 03)

iii. • පුරුෂ ජන සංඛ්‍යාවට වඩා ස්ත්‍රී ජන සංඛ්‍යාව වැඩිවීම. • බාල වයස් ජන සංඛ්‍යාව ක්‍රමයෙන් අඩුවීම.

• වියපත් ජන සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවීම. • ශ්‍රම බලකාය ද ක්‍රමයෙන් අඩුවීම. (ල. 05)

(07) i. • උතුරු මුහුදේ තෙල් සම්පත් හාරා ගැනීම. • වායු සමනය කිරීම.

• ව්‍යාපාරික ගව පට්ටි පාලනය • වන විනාශය

• න්‍යෂ්ටික අත්හදා බැලීම • පොසිල ඉන්ධන දහනය

• ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම ආදී .... (ල. 02)

ii. • දේශගුණික වෙනස්වීම් ඇතිවීම. • ධ්‍රැව අයිස් දිය වී මුහුදු මට්ටම ඉහළ යාම

• කලපු විනාශවීම හා ජලය ලවණීකරණය වීම.

• සාගර ජලයේ උෂ්ණත්වය වැඩි වී ජලජ ජීවීන් විනාශ වීම ආදී .... (පෙළ පොත 17 පිටුව) (ල. 03)

iii. a) • මත්ස්‍ය අස්වැන්න අඩුවීම නිසා ධීවරයින්ගේ ආදායම අඩුවීම.

• බිම් ලවණීකරණය වීම නිසා වගා බිම් අඩුවීම.

• රෝග වාහක කෘමීන්ගේ වර්ධනය නිසා ලෙඩ රෝග බහුලවීම.

• බෝගවල අස්වැන්න අඩුවීම. • පහත් බිම් මුහුදට යටවීමෙන් ජනාවාස අහිමිවීම ආදී ... (ල. 02)

b) • ඝන අපද්‍රව්‍ය කළමනාකරණය • වන වගාව ව්‍යාප්ත කිරීම.

• බහු භෝග, මිශ්‍ර භෝග වගාවන් හඳුන්වාදීම. • පොදු ප්‍රවාහන සේවා භාවිතය

• හරිතාගාර වායු පිටකරන බලශක්ති ප්‍රභව අඩුවෙන් භාවිත කිරීම.

• රසායනික පොහොර වෙනුවට ජෛවීය භාවිතය ආදී .... (ල. 03)

(08) i. a) විසුවියස් b) ක්‍රැකටෝවා (ල. 02)

ii. a) හරිකේන් b) සයික්ලෝන් c) ටයිෆූන් (ල. 03)

iii. a) • කැලණි ගඟ • කළු ගඟ • ගිං ගඟ • නිල්වලා ගඟ

• මහ ඔය • මහවැලි ගඟ මින් දෙකක් (ල. 02)

b) • ගංගා පෝෂක ප්‍රදේශවල වනාන්තර ආරක්ෂා කිරීම

• ගංගාවල මෝය විවෘතව තබාගැනීම.

• පහත් බිම් හා තෙත් බිම් ආරක්ෂා කිරීම.

• ගංගාවල වැලි ගොඩ දැමීම සීමා කිරීම.

• ජල ගැලීම් වලට ඔරොත්තු දෙන ඉදිකිරීම්වලට යොමුවීම.

• ප්‍රජාව දැනුවත් කිරීම. (ල. 03)